## 2021 වර්ෂයට සැපයුම්, සේවාවන් සහ කොන්ත්‍රාත් වැඩ සඳහා සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම

කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා වැඩ සැපයුම් හා සේවා ලබා ගැනීම පිණිස 2021 වර්ෂය වෙනුවෙන් ලියාපදිංචි වීමට කැමති පිළිගත් නිෂ්පාදකයින්ගෙන්/ දේශීය ඒජන්තවරුන්ගෙන්/ සැපයුම්කරුවන්ගෙන්/ සේවා සැපයුම්කරුවන්ගෙන් සහ කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

කොන්දේසි : -

1. පහත සඳහන් ආකෘතිය පරිදි සකස් කරන ලද අයදුම්පත් නිසි පරිදි සම්පූර්ණ කර 2020.11.15 දිනට පෙර දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,කළුතර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන ලියුම් කවරයේ වම් පස ඉහල කෙළවරේ "2021 වර්ෂය සඳහා භාණ්ඩ හා සේවා සැපයුම්කරුවන්/කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම" යනුවෙන් සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් කටයුතු කරනු නොලැබේ.
2. පහත සඳහන් **අයිතම අංක 01,02,03,සඳහා** කළුතර දිස්ත්‍රික්කයේ පිහිටුවාගෙන ඇති ආයතන සහ කොන්ත්‍රාත්කරුවන් වෙතින් අයදුම්පත් කැඳවනු ලබන අතර ඒ සඳහා අයදුම් කරන අයදුම්කරුවන් **තමන් ආයතනය පවත්වාගෙන යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි විය යුතු අතර, එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අමතරව වෙනත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සඳහාද ලියාපදිංචි වීමට අපේක්ෂා කරන ආයතන / කොන්ත්‍රාත්කරුවන් අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අමතරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ද ලියාපදිංචි විය යුතුය.**
3. සෑම අයදුම්කරුවෙක්ම ලියාපදිංචි වීමට අපේක්ෂිත එක් එක් අයිතමය සඳහා රු: 500/-ක මුදලක් ගෙවිය යුතුය. එම මුදල සඳහා ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් ලංකාබැංකුව, කළුතර ශාඛාවේ දිස්ත්‍රික් ලේකම්ගේ අංක 7041751 දරණ ගිණුමට බැර කර ලබාගත්බැංකු ලදුපත අයදුම්පත්‍රය සමඟ අමුණා එවිය යුතු අතර ලියාපදිංචි වීමේ ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.
4. ලියාපදිංචි වීමට කැමති එක් එක් අයිතමයන් සඳහා වෙන වෙනම ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතු අතර, එම සියලුම ඉල්ලුම්පත් එකම කවරයක බහා එවිය හැක.
5. ඉල්ලුම්කරුවන් ලියාපදිංචි කිරීමේ හෝ නොකිරීමේ අයිතිය දිස්ත්‍රික් ලේකම් සතුය.
6. සාමාන්‍යයෙන් ලියාපදිංචි වූ සැපයුම්, සේවා සැපයුම් සහ කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිල ගණන් කැඳවා භාණ්ඩ හා සේවා ලබා ගැනීමට සහ කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට ක්‍රියා කරන අතර, ප්‍රමාණවත් ලියාපදිංචි සැපයුම්කරුවන් නොමැති විට ඉන් පරිබාහිර ආයතන වලින් මිල ගණන් කැඳවා මිලදී ගැනීමේ සහ කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ අයිතිය දිස්ත්‍රික් ලේකම් සතුය.
7. මිල ගණන් ඉල්ලුම් කිරීමේදී ඉදිරිපත් නොකරන්නාවූද ඇණවුම් සඳහා නියමිත වේලාවට භාණ්ඩ නොසපයන්නා වූද, ඉදිරිපත් කළ සාම්පල් අනුව භාණ්ඩ නොසපයන්නාවූද සැපයුම්කරුවන්ගේ නම් දැනුම්දීමකින් තොරව ලියාපදිංචි ලේඛනයෙන් ඉවත් කිරීමට කටයුතු කරනු ඇත.
8. හදිසි අවශ්‍යතාවය සඳහා ණය පදනම මත භාණ්ඩ සැපයිය යුතු අතර, භාණ්ඩ සපයා මාසයක කාලයක් තුල බිල්පත් නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ.
9. බස්නාහිර පළාත තුළ ව්‍යාපාර පවත්වාගෙන යන තැනැත්තන් සම්බන්ධයෙන් වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

| <u>අයිතම් අංකය</u> | <u>විස්තරය</u> |
|---|---|
| 1. | ගොඩනැගිලි ඉදිකිරීම සහ අළුත්වැඩියාව |
| 2. | මහාමාර්ග, පාලම්, බෝක්කු ඉදිකිරීම සහ අළුත්වැඩියාව |
| 3. | වැව්, ඇලවේලි, කෘෂි ළිං ඉදිකිරීම සහ අළුත්වැඩියාව |
| 4. | සියලුම වෙල්ඩිං වැඩ හා ඇලුමිනියම් වැඩ |
| 5. | වෙනත් (විදුලිය ලබාදීම හා අළුත්වැඩියාව) |
| 6. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සුළු නඩත්තු කටයුතු |

7. සියලුම වර්ගවල ලිපිද්‍රව්‍ය සහ කාර්යාලයීය අවශ්‍යතා
8. පරිගණක ලිපිද්‍රව්‍ය (පරිගණක කඩදාසි, රිබන්, ඩිස්කට්, කාට්රිජ්, ඡායා පිටපත් යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර
9. සියලුම වර්ගයේ කාර්යාලයීය නිල නිවාස සංචාරක නිවාස උපකරණ
10. රබර් මුද්‍රා, දින මුද්‍රා සහ බ්ලොක්
11. පරිගණක යන්ත්‍ර, යතුරු ලියන, රෝණියෝ යන්ත්‍ර, පරිගණක මුද්‍රණ යන්ත්‍ර, ඇඟිලි සලකුණු යන්ත්‍ර, එකතු කිරීමේ යන්ත්‍ර සහ එම අමතර කොටස්
12. අභ්‍යන්තර දුරකථන පද්ධති, අන්තර්ජාල පහසුකම් සැපයීම
13. ලෝහ, ලී සහ ප්ලාස්ටික් නාම පුවරු
14. සියලුම වර්ගයේ මෝටර් රථ අමතර කොටස් සහ උපාංග
15. ටයර්, ටියුබ් සහ බැටරි
16. සියලුම වර්ගයේ ගොඩනැගිලි ද්‍රව්‍ය
17. ජලනල සහ ජලාපවාහන උපකරණ
18. සියලුම වර්ගයේ විදුලි උපකරණ/ බල්බ
19. වායු සමීකරණ යන්ත්‍ර සහ එම අමතර කොටස්
20. තීන්ත වර්ග සහ ඊට අදාළ ද්‍රව්‍ය සැපයීම
21. ක්‍රීඩා භාණ්ඩ සහ සුහසාධන භාණ්ඩ
22. පිඟන්, කෝප්ප, හැඳි, ගෑරුප්පු සහ වීදුරු වැනි භාණ්ඩ
23. නිල ඇඳුම්, වැහි කබා, සම්භාණ්ඩ සහ කාර්යාල බෑග්
24. සංගීත උපකරණ පෙරදිග හා අපරදිග
25. පිසූ ආහාර සහ තේ පැන් ආදිය සැපයීම
26. මහන මැෂින් හා ගොවි උපකරණ
27. පරිගණක යන්ත්‍ර, යතුරු ලියන, රෝණියෝ යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර සහ ගණක යන්ත්‍ර වැනි භාණ්ඩ අළුත්වැඩියාව
28. කාර්යාල ලී බඩු අළුත්වැඩියාව (පුටු වියීම, පොලිෂ් වැඩ ඇතුළුව)
29. කාර්යාලයීය වැඩ වානේ උපකරණ අළුත්වැඩියාව
30. පවිත්‍රතා සේවා සැපයීම
31. ආරක්ෂක සේවා සැපයීම
32. ස්ථිර ජංගම දුරකථන පහසුකම් හා අන්තර්ජාල පහසුකම් සැපයීම
33. සියලුම වර්ගවල වාහන අලුත්වැඩියාව
34. වාහන සේවා කිරීම
35. වාහන වායු සමීකරණ කිරීම
36. වාහන කුෂන් වැඩ
37. ශීතකරණ යන්ත්‍ර, වායුසමීකරණ යන්ත්‍ර, ඇතුළු විදුලි උපකරණ අළුත්වැඩියාව
38. රෙදි සේදීම, පිරිසිදු කිරීම ආදිය (සංචාරක බංගලාව)
39. ඩිජිටල් මුද්‍රණ කටයුතු සහ බැනර් සකස් කිරීම
40. කාර්යාල උපකරණ වානේ හා ලි බඩු සැපයීම්
41. බහු ප්‍රක්ශේපන යන්ත්‍ර, ශබ්ද පරිපාලන යන්ත්‍ර හා ඒ ආශ්‍රිත සියළුම විද්‍යුත් උපකරණ
42. වාහන කුලියට ලබා ගැනීම (සැහැල්ලු සහ බර වාහන)

තිලංකා වෙත්තසිංහ,
දිස්ත්‍රික් ලේකම් (රා.ආ.),
කළුතර පරිපාලන දිස්ත්‍රික්කය.

## කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
## ආදර්ශ අයදුම් පත්‍රය
## සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2021

1. සැපයුම්කරුවන්ගේ / කොන්ත්‍රාත්කරුවන්ගේ නම

   ........................................................................................................................

2. ලිපිනය :

   ........................................................................................................................

3. දුරකථන/ෆැක්ස්/ඊ මේල්
   :.........................................................................................

4. ව්‍යාපාරයේ වෙළඳ නාමය :
   .........................................................................................

5. ව්‍යාපාරයේ ලියාපදිංචි අංකය:........................................................................................
   (ලියාපදිංචි සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය)

6. ලියාපදිංචි වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය:-
   (අයිතම අංක 01,02,03 සඳහා)
   ........................................................................................................................

7. සපයනු ලබන භාණ්ඩ හා සේවාවන් :........................................................................

8. ව්‍යාපාරයේ ස්භාවය :........................................................................................
   (නිෂ්පාදක/ප්‍රධාන වෙළඳ නියෝජිත/තොග වෙළඳ නියෝජිත යන්න සඳහන් කරන්න)

9. ණය පදනම මත සැපයීම පිළිබඳ විස්තර
   :..................................................................
   (ණය වටිනාකම සහ කාල සීමාව)

10. වැට් ලියාපදිංචි අංකය
    :..........................................................................................
    (වැට් සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය)

11. බැංකුකරුගේ නම සහ ලිපිනය :..........................................................................

12. කොන්ත්‍රාත්කරුවකු නම්, CIDA / ICTAD ආයතනයේ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවකු ලෙස ලියාපදිංචි ශ්‍රේණිය :

.............................................................................................

(ලියාපදිංචි සහතිකයේ පිටපතක් සහ පසුගිය වසර 03 තුළ සිදුකළ ඉදිකිරීම් / අළුත්වැඩියාවන් පිළිබඳ වාර්තා ඇමිණිය යුතුය)

13. i. එක් එක් අයිතමයන් සඳහා ගෙවන මුදල :..............................................................

ii. (ලදු පත ඇමිණිය යුතුය)

14. වෙනත් වැදගත් විස්තර:.........................................................................................

ඉහත දක්වා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරන අතර, කිසියම් සාවද්‍ය තොරතුරක් සපයන ලද බවට හෙළි වුවහොත් ලියාපදිංචිය අවලංගු කිරීමට යටත් වන බවත් මම දනිමි.

.......... ..................................

දිනය අයදුම්කරුගේ අත්සන